(දැනුම් දීමේ පත්‍රය)

ගෙවීම් කාල සීමාව ඉකුත් වුවද ඔබගේ මහජන සෞඛ්‍ය රක්ෂණ මුදල් තවමත් ගෙවා නොමැත.

මෙම දැනුම් දීම් පත්‍රයේ සඳහන් කාල සීමාව තුළදී එම රක්ෂණ මුදල් බැංකු, කොන්විනියන් ස්ටෝර් ආදියෙහි ගෙවීම් කරන්න.

එකවරට එම මුදල් ගෙවීමට අපහසුවක් තිබේ නම් මහජන සෞඛ්‍ය රක්ෂණ අංශය (ෆුනබෂි නගර සභා 1 වන මහල) වෙත ඇති බදු ගෙවීම් උපදෙස් සේවාව වෙතින් උපදෙස් ගන්න.

රූපවාහිනී දුරකථන පරිවර්තන සේවාව භාවිතා කරමින් බදු උපදෙස් ලබාගත හැකි බැවින් ජපන් භාෂාව නොදැන සිටියද ගැටළුවක් නොමැත.

## දැනුම් දීම් පත්‍රයේ සැකිල්ල




(සැළකිය යුතු කරුණු)

- මහජන සෞඛ්‍ය රක්ෂණ මුදල් ගෙවීම් පිළිබඳ උපදෙස් ලබා නොගන්නා විටකදී, සෑම වර්ෂයකම ජනවාරි මස, අප්‍රේල් මස හා සැප්තැම්බර් මසදී මෙවැනි දැනුම් දීමේ පත්‍රිකාවක් එවනු ලැබේ.
- නියමිත කාල සීමාව තුල ගෙවීම් නොකරන විටෙක හිඟ මුදල් වර්ධනය වීම පමණක් නොව, ඔබට අයත් වත්කම් පරීක්ෂා කරන අතර, ඒවා පවරා ගැනීම ඇතුලුව නීත්‍යානුකූලව දඬුවම් කරනු ලබයි.
- විශේෂ හේතුවක් නොමැතිව මුදල් ගෙවීම් පැහැර හැරීම් කරන විට, මහජන සෞඛ්‍ය කාඩ් පත ආපසු ලබා ගැනීම කරනු ලබයි.